# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,508—1946ක්වූ ජනවාරි මස 25 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Kegalla No. 67.**—සබරගමු දිසාවේ කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1946ක්වූ මාර්තු මස 20වෙනි දිනවූ බදාදා පූ. භා. 11ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ ගල්බොඩ, කිනිගොඩ දෙකෝරළ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 16ක්.

මුල් සිතියමේ අංක. A 24.—දිවුල පල්ලේගම, අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | ලොම් එකට මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මිල්ලගහහේන නොහොත් ගල්කඹුල්ලේගල්දූන්නේ මූකලාන | — .. | අවසර නොමැතිව දිංවෙල පල්ලේගම ජී. පී. කිරිමැණිකා සහ රන්බණ්ඩියා අල්ලාගත් වත්ත | 0 | 1 | 17 | 26* |
| 2 | ගල්ගොඩහේන .. | — .. | අවසර නොමැතිව දිංවෙල ආර්. මොහොතා සහ තවත් අය අල්ලාගත් වත්ත | 0 | 1 | 16 | 21* |
| 3 | ගල්කඹුල්ලේ ගල් දූන් නේ මූකලාන | — .. | මූකලාන .. .. .. | 0 | 1 | 31 | 28† |
| 4 | එම .. | — .. | ගස්සහපැරට වෙන්කරනලද බිම්තීරය .. | 0 | 0 | 16 | —‡ |
| 5 | ගල්කඹුල්ලේතැන්න .. | — .. | අම්බලමකට වෙන්කර තිබෙන බිම්කෑබිය .. | 0 | 0 | 5 | —‡ |
| 7 | ගල්කඹුල් ලේ ගල් දූ න් නේ මූකලාන | — .. | මූකලාන .. .. .. | 1 | 0 | 24 | 66† |
| 8 | නිකතැන්නේවත්ත නොහොත් මැල්ලගලහේන | — .. | අවසර නොමැතිව ආර්. පී. හොරතලා අල්ලාගත් වත්ත | 0 | 0 | 35 | 17* |
| 9 | ගල්කඹුල් ලේ ගල් දූ න් නේ මූකලාන | — .. | මූකලාන .. .. .. | 0 | 1 | 4 | 21† |
| 10 | මැලගලහේන නොහොත් මැල්ලගලවත්ත | — .. | අවසර නොමැතිව දිංවෙල මැණිකාගේ පුත් ආර්. පී. පුංචි උක්කුවා අල්ලාගත් වත්ත | 0 | 1 | 25 | 19* |
| 11 | එම .. | — .. | එම .. .. .. | 1 | 2 | 13 | 54* |
| 13 | දංගහමැදදෙනිය .. | — .. | උල්පතකට වෙන්කර තිබෙන දෙනිය .. | 0 | 0 | 24 | —‡ |
| 14 | මැල්ලගලහේන .. | — .. | අවසර නොමැතිව මැණිකාගේ පුත් ආර්. පී. පිංචි උක්කුවා අල්ලාගත් වත්ත | 0 | 0 | 25 | 16* |
| 15 | ගල්කඹුල්ලේ ගල් දූ න් නේ මූකලාන නොහොත් මැල්ලගලහේන | — .. | මලඇළට වෙන්කර තිබෙන බිම්තීරය .. | 0 | 2 | 4 | —‡ |
| 16 | එම .. | — .. | අවසර නොමැතිව කිරිබණ්ඩියාගේ පුත් ආර්. පී. පිංචි උක්කුවා අල්ලාගත් වත්ත | 0 | 0 | 32 | 18* |
| 17 | මැලගලහේන නොහොත් මැල්ලගලවත්ත | — .. | අවසර නොමැතිව මැණිකාගේ පුත් ආර්. පී. පිංචි උක්කුවා අල්ලාගත් වත්ත | 1 | 0 | 3 | 31* |
| 18 | එම .. | — .. | අවසර නොමැතිව දිවුල පිංචිඅප්පුහාමි අල්ලාගත් වත්ත | 0 | 0 | 39 | 13* |

* අංක 383 දරණ ඉඩම් ආඥාපනතේ යටතේ බේරුම්කරදීම පිණිසයි.

† වෙන්දේසිකිරීමට.

‡ වෙන්කර තිබෙන බිම්තීර (වෙන්දේසිනොකරනු ලැබේ).

මේ ඉඩම් සම්බන්ධව වැඩිදුර විස්තර කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද දැනගත හැක.

වර්ෂ 1946ක්වූ ජනවාරි මස 7වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ජී. ඇල්. ඩී. ජේම්ස්,
අතිරේක ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා විසින්.

---

**No. 13,929, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1946ක්වූ මාර්තු මස 15වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට බෙලිහුල්ඔය සංචාරක නිවාසයේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත කෝරළේ කලපිටගම්පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 21ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ අංක. 641. ගම—උඩමද්දේපිටියවල (කොටසක්).

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 74 | අරළුගස්තැන්න .. | ලමාහේවාගේ ජෝසැප් ප්‍රනාන්දු .. .. | අත්හැරපුහේන් | 0 | 0 | 23 |
| 75 | එම .. | එම .. .. .. | එම .. | 4 | 1 | 38 |
| 77 | අරළුගස්තැන්නේහේන | (1) කිරිමැටිතැන්නේ පදිංචි විරසේකරවික්‍රමරාජසින්හපණ්ඩිතමුදියාන්සේලාගේ විරසේකර මද්දුමබන්ඩාර, (2) මොරහෙල පදිංචි එම එම එම එම එම පුන්චිබණ්ඩාර, (3) මිරහවත්තේ පදිංචි එම එම එම එම එම ලොකු කුමාරිහාමි, (4) සිංලෝගම පදිංචි එම එම එම එම එම ලොකුබන්ඩාරගේ කිරිබන්ඩාරගේ උරුමක්කාරයෝ, (5) හල්දෙල පදිංචි එම එම එම එම එම පුන්චිකුමාරහාමිගේ උරුමක්කාරයෝ | හේන .. | 1 | 1 | 39 |
| 78 | එම .. | මහනුවර පදිංචි විරසේකරවික්‍රමරාජසින්හපණ්ඩිතමුදියන්සේලාගේ විරසේකර විලියම් බන්ඩාරගේ උරුමක්කාරයෝ | එම .. | 1 | 2 | 2 |
| 80 | එම .. | බලන්ගොඩ මොරහැල පදිංචි විරසේකරවික්‍රමරාජසින්හපණ්ඩිතමුදියාන්සේලාගේ විරසේකර කිරිබන්ඩාරගේ කිරිබන්ඩාරගේ උරුමක්කාරයෝ | එම .. | 1 | 2 | 6 |

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 81 | අරඹගස්හැන්නේහේන | දෙල්ගහතැන්නේ (බලන්ගොඩ) පුස්වෙලගොඩැල්ලරාලලාගේ රතුහාමි | හේන | .. 0 | 2 | 3 |
| 83 | එම .. | (1) ඉඹුලමුරේ පදිංචි වීරසේකරවික්‍රමරාජසිංහපන්ඩිතමුදියාන්සේලාගේ වීරසේකර ජිනදාස බන්ඩාර, (2) එම එම එම එම එම එම පියදාස බන්ඩාර, (3) එම එම එම එම එම එම බින්ගිරි කුමාරිහාමි | එම | .. 1 | 2 | 10 |
| 86 | දෙඹගහමඩිත්තේහේන | (1) කුඹුරුතැන්වල පදිංචි ලක්සේමුදියාන්සේලාගේ කිරිමොහොට්ටිහාමි, (2) ඔපනායක පදිංචි බොරඑගොඩරාලලාගේ පුන්චිහෝනා, (3) එම කන්දේගෙදරගමරාලලාගේ සුවා, (4) ඉහල ගලගම පදිංචි ලක්සේමුදියන්සේලාගේ කිරිබන්ඩා, (5) පුවක්ගහවල පදිංචි වීරතුංගරාල්ලගේ බින්ගිරිමැනිකා, (6) එම එම එම පුන්චිබන්ඩා, (7) වීරතුංගරාල්ලගේ හීන්මුදියාන්සේ, (8) නල්දෙන පදිංචි දිසානායකමුදියාන්සේලාගේ අප්පුහාමි, (9) බලන්ගොඩ පදිංචි ආර්. ඇම්. උක්කුබන්ඩා | එම | .. 1 | 0 | 3 |
| 90 | පාඹුල්පොතේහේන .. | (1) වලේබොඩ පදිංචි කිරියාවියන්නලාගේ අල්ලිසා, (2) දඹවින්නේ පදිංචි එම එම එන්සා | එම | .. 0 | 3 | 1 |
| 91 | එම .. | වලේබොඩ පදිංචි කිරියාවියන්නලාගේ බින්ගිරා .. | එම | .. 0 | 3 | 3 |
| 93 | එම .. | (1) යක්දෙහිවල පදිංචි රත්නායකමුදියාන්සේලාගේ පුන්චිමැනිකා, (2) අස්වැද්දුන්වෙල පදිංචි එම එම මැනික්හාමි, (3) යක්දෙහිවල පදිංචි එම එම හීන්මැනිකේ, (4) වැලිගේපොල පදිංචි එම එම කුඩාමහත්මයා, (5) බෝගහකුඹුරේ පදිංචි එම එම පුන්චිමැනිකේ, (6) වැලිගේපොල පදිංචි එම එම රම්මැනිකේ, (7) රත්මල්විත්තේ පදිංචි එම එම ලොකුමැනිකේ, (8) අස්වැද්දුන්වෙල පදිංචි එම එම කිරිඅප්පුහාමි, (9) බලිතැන්නේ පදිංචි එම එම බින්ගිරි මුදියාන්සේ, (10) කිත්විගුණේ පදිංචි එම එම මුතුමැනිකේ, (11) අස්වැද්දුන්වෙල පදිංචි එම එම බින්ගිරි මුදියාන්සේ, (12) වැලිගේපොල පදිංචි එම එම රම්මැනිකේ, (13) කුඹුරුතැන්වෙල පදිංචි එම එම අප්පුහාමි, (14) ඉඹුල්පේ පදිංචි මාතොටගමරාලලාගේ කිරිඅප්පුහාමි, (15) වැලිගේපොල පදිංචි රත්නායකමුදියාන්සේලාගේ හීන්මැනිකේ, (16) අස්වැද්දුන්වෙල පදිංචි එම එම පුංචිබන්ඩා, (17) කල්තොට පදිංචි බෝගහකුඹුරේගමරාලලාගේ රතුන්හාමි, (18) යක්දෙහිවල පදිංචි ගජනායකමුදියාන්සේලාගේ බින්ගිරි මුදියාන්සේ, (19) එම එම එම බින්ගිරිමැනිකා, (20) එම එම එම හීන්මැනිකා, (21) කුඹුරුතැනිවල පදිංචි විහාරේවෙලවිදානලාගේ බින්ගිරි මැනිකා, (22) කුඹුරුතැනිවෙල පදිංචි එම එම පුන්චිමහත්මයා | එම | .. 2 | 2 | 12 |
| 95 | එම .. | බෙලිහුල්ඔයේ පහල ගලගම පදිංචි මහබදුගේ ජුවන් ප්‍රනාන්දු .. | එම | .. 1 | 3 | 22 |
| 97 | එම .. | (1) රත්නපුරේ රටේමහත්මයා වන ඩබ්ලිව්. වී. එල්ලවල, (2) කොළඹ කොල්ලුපිටියේ රසින්ලන්ඩ්ස් ගාර්ඩන්ස්හි පදිංචි ඇල්. සී. විජේසිංහ හෝනාමහත්මී, (3) බලන්ගොඩ පදිංචි සී. ඩබ්ලිව්. දන්ගමුව හෝනාමහත්මී, (4) කහවත්තේ අවකලන්පත්තේ පදිංචි සිබිනි එල්ලවල, (5) රුවන්වැල්ලේ පදිංචි ජේ. එච්. මීදෙනිය හෝනාමහත්මී, (6) පේරාදෙනියේ පදිංචි සී. එච්. දුනුවිල හෝනාමහත්මී | එම | .. 1 | 0 | 36 |
| 98 | මීඅඹගහකුඹුරේගොඩහේන | බලන්ගොඩ පදිංචි සිරිල් එල්ලවලවල හෝනාමහත්මී .. | එම | .. 1 | 0 | 34 |
| 99 | එම .. | බලන්ගොඩ පදිංචි ඒ. ඕ. ජයවර්ධන හෝනාමහත්මී .. | එම | .. 1 | 0 | 36 |
| 100 | එම .. | (1) පැල්මඩුල්ලේ පදිංචි සිසිල් ගුනසේකර, (2) රත්නපුරේ එච්. ඒ. ගුනසේකර බාගේ මිනි ද සිල්වා හෝනාමහත්මී, (3) මොරහෙල පදිංචි චාර්ල්ස් ගුනසේකර, (4) රත්නපුරේ එච්. ඒ. ගුනසේකර බාගේ හැක්ටර් ගුනසේකර, (5) එම එම රොබට් ගුනසේකර, (6) රත්නපුරේ ආනන්ද මදන හෝනාමහත්මී | එම | .. 1 | 0 | 37 |
| 101 | මීඅඹගහකුඹුරේගොඩහේන | බලන්ගොඩ පදිංචි බාත්ෂ් රත්වත්තේ හෝනාමහත්මී .. | එම | .. 1 | 0 | 38 |
| 102 | පල්ලේමඩේපිටහේන්යාය | බෙලිහුල්ඔයේ පහල ගලගම පදිංචි මහබදුගේ ජුවන් ප්‍රනාන්දු .. | එම | .. 2 | 1 | 19 |
| 103 | එම .. | බින්තැකිගොල්ලේ පදිංචි රත්නායකමුදියාන්සේලාගේ කුන්මැනිකේ | එම | .. 0 | 2 | 15 |
| 104 | එම .. | (1) නාවෙල පදිංචි රත්නායකමුදියාන්සේලාගේ ලොකුමැනිකා, (2) පහල ගලගම පදිංචි එම එම කිරිඅප්පුහාමි, (3) ඉඹුල්පේ පදිංචි එම එම එම රත්මැනිකාගේ කිරිඅප්පුහාමි | එම | .. 0 | 2 | 15 |
| 111 | එම .. | (1) රත්නපුරේ වානසුන්දරමුහන්දිරමලාගේ පුන්චිමහත්මයා, (2) රත්නපුරේ හකමුවේ පදිංචි වැල්ලක්කොටමුදියාන්සේලාගේ ගුනරත්න බන්ඩා, (3) උඩමඩිත්තේ පිටවෙල දසනායකමුදියාන්සේලාගේ පුන්චිබන්ඩා | එම | .. 1 | 2 | 26 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට අඩුනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1946ක්වූ ජනවාරි මස 21වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ජී. ඇල්. ඩී. ඩේවිඩ්සන්,
අතිරේක ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කේ/උඩුගම පල්ලේගම (හල්පිහිල්ල) ස්වභාෂා මිශ්‍ර පාඨශාලාවේ වත්ත පළල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ තරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලය පිට පලාත් පාලක කාරක සභාවෙන් නියමකාර මට අණ ලැබී තිබේ; ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,087, ගම—උඩුගම පල්ලේගම.

| අංකය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ඊරියගස්හැන්න නොහොත් හෙම්පිටවත්ත | හෙම්ලිකළ මැටි ගෙයක් සහ ඔඩුවක් සහිත ගේ ඉඩම | එම්. රෙවත ථෙර, මහවත්ත, ගුරුදෙනිය | 0 | 0 | 34·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඔහැකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම හමුවීම හෝ නොහොත් කමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පෙරවරු 10.30ගේ කතිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඊට ඇත්තාවූ කමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ම ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මම් 1946ක්වූ ජනවාරි මස 19වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඒ. ඇස්. කොහොඹන්-වික්‍රම,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

ආණ්ඩුවේ කටයුත්තකට එනම් :—නාවලපිටියේ පළාත් ආණ්ඩු සභාවට ගබඩාකාමරයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලය පිට පළාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. A 1,050. ගම—නාවලපිටියේ පළාත් ආණ්ඩු සභා සීමා තුළ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | බ්‍රිජ්ජ්වත්ත, කවුන්සිල් පාරේ වරිපනම් නො. 4 | රබර් ඉඩම .. | සීමාසහිත ද නාවලපිටිය බිල්ඩිං සින්ඩිකේට් (ඒජන්තවරු: බවුස්ටඩ් සහෝදරයෝ, කොළඹ) | 0 | 0 | 18·35 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ මනාකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පෙරවරු 11ට කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ජනවාරි මස 18වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ජී. වී. බයිසන්,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වමහ.

———

(203වෙනි පරිච්ඡේදයේ 5වෙනි කාණ්ඩයේ ප්‍රකාරයට) ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—දික්වැල්ලේ ආණ්ඩුවේ මධ්‍යම පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ (203වෙනි පරිච්ඡේදයේ)" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. P. P. A 950. ගම—දෙඩම්පහල බස්නාහිර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | අහේරගේන .. | අවුරුදු 70 වයසැති පොල්ගස් තිබෙන වත්ත, අවුරුදු 60 වයසැති කොස්ගස් 9, අවුරුදු 5 වයසැති කොස්පැල 4, අවුරුදු 50 වයසැති දෙල්ගස් 2, අවුරුදු 8 වයසැති දෙල්ගස් 6, අවුරුදු 12 වයසැති මහගනීගස් 1, අවුරුදු 8 වයසැති දූහුම්දෙලගස් 1, අවුරුදු 20 වයසැති සපදිල්ලගස් 1, අවුරුදු 15–25 වයසැති අඹගස් 5, අවුරුදු 15–25 වයසැති පුවක්ගස් 50, අවුරුදු 15 වයසැති කිතුල්ගස් 15, අවුරුදු 20 වයසැති දෙඩම්ගස් 4, උළු සෙවිලිකරපු මැටි ගෙයක් සහ අතු සෙවිලිකරපු බැම් ගෙයක්ද තිබේ | දික්වැල්ල, දෙඩම්පහල පදිංචි ඩී. ඇස්. විජේතුංග, තංගල්ලේ පදිංචි මිලි නෝනා විජේතුංග, රඹුක්කන පදිංචි පී. සයිමන් සිල්වා සහ තංගල්ලේ වල්ගන්එලියේ පදිංචි ඒ. විජේතුංග නෝනාමහත්මිය | 2 | 3 | 9·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ මනාකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 27වෙනි දින පෙරවරු 10ට කාලයට දික්වැල්ලේ ගම්සභා ශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ජනවාරි මස 17වෙනි දින මාතර කච්චේරියේදීය.

ඇම්. රාජේන්ද්‍ර,
මාතර ආණ්ඩුවේ උප ඒජන්ත වමහ.

———

(203වෙනි පරිච්ඡේදයේ 5වෙනි කාණ්ඩයේ ප්‍රකාරයට) ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—දික්වැල්ලේ ආහාරගබඩාශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ (203වෙනි පරිච්ඡේදය)" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. P. P. A 966. ගම—බතිගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | දන්ගහගේන .. | අවුරුදු 15 වයසැති කොස්ගස් 23, කජුගස් 16, දෙල්ගස් 1, පුවක් ගස් 15, පොල්ගස් සහ පාරකින් කොටසක් තිබෙන වත්ත | දික්වැල්ල බතිගම පදිංචි දඹල්ලගේ දිනගහාමි, දික්වැල්ල බතිගම පදිංචි විරසිංහ ආමිස්හාමි, දික්වැල්ල බතිගම පදිංචි විරසිංහ ජේසිනෝනා, බෙලිඅත්තේ කුඩාහෙල පදිංචි දඹල්ලගේ කාමිසින්හාමි, බතිගම පදිංචි බෙනඩික් ද සිල්වා, එච්. ආර්. අමරදාස සහ අනිකුත් අය | 0 | 3 | 39·7 |
| 2 | මලපලා සියඹලාගස් ආර | අවුරුදු 50ක පමණ වයස ඇති පොල්වත්තක්ද, එහි තුල මැටි ගෙයක් හාදකාලද පොල්අතු ගෙයක්ද තිබේ | බතිගම පදිංචි කේ. පුන්චිහාමිනේ, ඇල්. බී. ද සිල්වා, බී. බෙනඩික් ද සිල්වා, ඇන්. කොර්නේලිස් අප්පු සහ අනිකුත් අය | 2 | 0 | 13·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ මනාකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ පෙබරවාරි මස 27වෙනි දින පෙරවරු 11ට කාලයට දික්වැල්ලේ ගම්සභා ශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ජනවාරි මස 18වෙනි දින මාතර කච්චේරියේදීය.

ඇම්. රාජේන්ද්‍ර,
මාතර ආණ්ඩුවේ උප ඒජන්ත වමහ.

———

මේ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනිවගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට එනම් :—KG/මාවතගොඩ පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ (203වෙනි පරිච්ඡේදයේ)" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

මූල් සිතියමේ නො. A 494. ගම—මැනව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | අපල්ලේකැටියේවත්ත | අවුරුදු 60 පොල්ගස් 3, අවුරුදු 12 පොල්ගස් 1, අවුරුදු 5 පුවක්ගස් 2, අවුරුදු 20 පුවක්ගස් 1, අවුරුදු 50 කොස්ගස් 3 සහ අඹගස් 6, අවුරුදු 5–10 අඹගස් 4, අවුරුදු 3–8 කිතුල්ගස් 3, අවුරුදු 10–20 කරදගස් 1 සහ කහටගස් 4, අවුරුදු 50 කෝණගස් 1, අවුරුදු 20 මීගස් 1, අවුරුදු 10 දවටගස් 1, අවුරුදු 40 හුනගස් 1, අවුරුදු 5–10 වල්දෙල්ගස් 3, අවුරුදු 25 වල්දෙල්ගස් 1, අවුරුදු 50 දූහුම්දෙල්ලගස් 1, අවුරුදු 25 සියඹලාගස් 1 සහ කෙසෙල්පඳුරු තිබෙන ඉඩම | මැනව පදිංචි මැනවරලලාගේ මුදියන්සේ, මැනවරලලාගේ පුංචිබණ්ඩා, මැනවරලලාගේ පුංචිරාලහාමි, මහආරච්චිලාගේ කිරිබණ්ඩා සහ මෙගසූරිය මුදියන්සේලාගේ කලුකුමැණිකා | 1 | 0 | 5·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1946ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පූ. භා. 10ගේ කනිසමට දිප්පිටියේ සැයි බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතියේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1946ක්වූ ජනවාරි මස 16වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ඊ. කේ. ජේ. හෙන්ඩර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාවශ්‍යතාතාව, ඒ නම්:— KG/දිප්පිටියේ දෙමළ පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 203 පරිච්ඡේදය පස්වනි කාණ්ඩයේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට පළාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ; ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 500. ගම—දිප්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | පල්ලේවත්ත .. | අවුරුදු 42 පොල්ගස් 1, අවුරුදු 5 පොල්පැළ 1, අවුරුදු 12 රබර්ගස් 1, අවුරුදු 5 දෙහිගස් 1, අවුරුදු 20–25 කැටකෑලගස් 2 සහ කෙසෙල් පඳුරු 13 තිබෙන ඉඩම | දිප්පිටියේ වී. ඇස්. සුල්තාන් මරික්කාර් | 0 | 0 | 29·2 |
| 2 | පල්ලේවත්තෙත්තැන්න | අවුරුදු 35 පොල්ගස් 2, මඤ්ඤොක්කා සහ අඩි පාරක කෑල්ලක් තිබෙන ඉඩම | දිප්පිටියේ හජ්ජි, ඒ. ඒ. මරික්කාර් සහ අබ්දුල් රහිමන් | 0 | 2 | 38·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1946ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පූ. භා. 10ගේ කනිසමට දිප්පිටියේ සැයි බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතියේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1946ක්වූ ජනවාරි මස 15වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ඊ. කේ. ජේ. හෙන්ඩර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## 1939ගේ නොම්මර 61 දරණ නගර සභා ආඥාපණත යටතේ සාමාජිකයන් තේරීමේ දැන්වීම.

### කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාවේ නොම්මර 7ගේ අස්වැද්දුම නැගෙනහිර කොට්ඨාශයට මන්ත්‍රී කෙනෙක් තේරීම.

කුලියාපිටිය පළාත් ආණ්ඩු සභාවේ අංක 7 දරණ අස්වැද්දුම නැගෙනහිර කොට්ඨාසයට නියමිත පරිදි තෝරාගනුලැබූ මන්ත්‍රී වන ඒ. යූ. බී. ඇපාසාහු මහතා වර්‍ෂ 1939ගේ අංක 61 දරණ පළාත් ආණ්ඩු ආඥාපනතේ 18 (1) *a* වෙනි වගන්තිය යටතේ එම මන්ත්‍රී ධුරය ප්‍රතික්‍ෂෙපකරනලදින්, වර්‍ෂ 1939ගේ අංක 61 දරණ පළාත් ආණ්ඩු පනතේ 18 (3) වෙනි වගන්තිය යටතේ වර්‍ෂ 1946ගේ මාර්තු මස 4වෙනි සඳුදා කුලියාපිටිය පළාත් ආණ්ඩු සභාවේ අංක 7 දරණ අස්වැද්දුම නැගෙනහිර කොට්ඨාශයට අතුරු තෝරාගැනීමක් පවත්වන්ට අදහස්කරගෙන තිබෙන බව වර්‍ෂ 1940ගේ අංක 14 සහ වර්‍ෂ 1942ගේ අංක 3 දරණ ආඥාපනත්වලින් සංශෝධිතවූ ඉහතකී ආඥාපනතේ 10වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. සෑම ඉල්ලුම්කරුවෙකුම නාම යෝජනාපත්‍ර එකක් හෝ වැඩි ගණනකින් නම් සඳහන්කරනු ලැබීමෙන් ඉදිරිපත්විය යුතුයි.

(*a*) එම නාම යෝජනාපත්‍ර එකිනෙක අංක 7 දරණ අස්වැද්දුම නැගෙනහිර කොට්ඨාශයේ ඡන්දදායක ලැයිස්තුවේ නම් පෙනෙන අඩු වශයෙන් දෙදෙනෙකු විසින් අත්සන්කළ යුතුයි.

(*b*) එකී නාම යෝජනාපත්‍ර ඉල්ලුම්කරුවාගේ කැමැත්ත එහි ලියා හෝ ඊට අමුණා හෝ මෙහි පහත නම් සඳහන් අයට වර්‍ෂ 1946ගේ මාර්තු මස 4වෙනි සඳුදා පෙරවරු 11.30ට සහ පස්වරු 12.30ටද අතර කාලය තුළ කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභා කාර්‍යාලයේදී භාරදිය යුතුයි.

3. වර්‍ෂ 1946ගේ මාර්තු මස 4වෙනි සඳුදා පෙරවරු 11ට ප්‍රථම මෙහි පහත සඳහන් අය වෙත රුපියල් 100 (සියයක්) ඉල්ලුම්කරුවාගේ ඉල්ලීම වෙනුවෙන් තැන්පත්නොකළොත් කිසිම ඉල්ලුම්කරුවෙකු නියමිත පරිදි නාම සඳහන්කිරීමෙන් ඉදිරිපත්කළ බව නොසලකනු ලැබේ.

4. ඉහතකී මන්ත්‍රීවරයකු තෝරාගනුලබන කොට්ඨාශයට නියමිත පරිදි සුදුසු ඉල්ලුම්කරුවන් එක්කෙනෙකුට වඩා නම් සඳහන්කිරීමෙන් ඉදිරිපත්කරනු ලැබුවොත් වර්‍ෂ 1946ගේ මාර්තු මස 18වෙනි සඳුදා කුලියාපිටියේ ආණ්ඩුවේ මිශ්‍ර පාඨශාලාවේදී ඡන්දයක් විමසනු ලැබේ. ඡන්දය විමසීම පෙරවරු 8ට පටන්ගෙන දහවල් 12ට නවත්වා නැවත පස්වරු 1.30ට පටන්ගෙන පස්වරු 4ට අවසානකරනු ලැබේ.

සී. ඇෆ්. පෙරේරා,
වයඹ දිසාවේ ආණ්ඩුවේ මහ ඒජන්ත වම්හ.

වර්‍ෂ 1946ක්වූ ජනවාරි මස 23වෙනි දින
කුරුණෑගලදීය.

## අභ්‍යන්තර වී මිලයට ගැනීමේ ක්‍රමය.

### කළුතර කොටමුණේ ගොයම් කපා පාගාගැනීම, 1946 මාස් මෝසම.

ආරක්‍ෂක (මිශ්‍ර) ව්‍යවස්ථාවේ 37 වන වගන්තියෙන්ද, ආරක්‍ෂක (ආහාර ද්‍රව්‍ය මිලයට ගැනීමේ) නියෝගයන්ගෙන් සහ 1943 ආරක්‍ෂක (වී ගොවිතැන් පිළිබඳ) ව්‍යවස්ථාවෙන්ද මා වෙත පැවරී තිබෙන බලය පිට කළුතර කොටමුණ තුළ පිහිටි සවර කුඹුරක නමුත් ගොයම් කැපීම භාරවූ සෑම කුඹුරු හිමියා විසින් හෝ ගොවියා විසින්ම—

1. පහත පෙනෙන ලේඛනයේ සඳහන් කුඹුර පිහිටි කොට්ඨාශයේ "ෆීල්ඩ් ඇසිස්ටන්ට්" තැන විසින් යම්කිසි වෙලක් තක්සේරුකරනතෙක් ගොයම් නොකැපිය යුතුයි.

2. කොට්ඨාශයේ වෙල් මූලාදැනියාට දවස් 4ට කලින් ගොයම් කපා පාගන දිනය සහ වේලාව දැන්විය යුතුයි.

3. වෙල් විදානේගෙන් ලියවිල්ලකින් ලත් අවසරයක් ඇතුව මිස වී පෑගීම සවස 7ගේ සිට උදේ 7 දක්වා නොකළ යුතුයි.

4. 1943ගේ ආරක්‍ෂක (වී ගොවිතැන පිළිබඳ) ව්‍යවස්ථාවේ දසවන වගන්තිය අනුව කුඹුරු, අස්වැන්න, කොටස් යනාදිය සහ අයිතිකරුවන් පිළිබඳ විස්තර ගම් මූලාදැනියා, වෙල් මූලාදැනියා, "ෆීල්ඩ් ඇසිස්ටන්ට්" හෝ ඔව්හින් බලය පවරා තිබෙන කෙනෙකු ඉල්ලුවිටක දිය යුතුයි.

5. වෙල් මූලාදැනියා විසින් හෝ ඔහු විසින් බලය පවරණලද කෙනෙකුන් විසින් මුළු අස්වැන්න සහ වෙනත් අයිතිකරුවන්ගේ කොටස් සටහන්කිරීමට ප්‍රථමද වෙල පිහිටි ගමේ ගම් මූලාදැනියාගෙන් එම වී ගෙනයාමට බලපත්‍රයක් නොමැතිවද කුඹුරෙන් හෝ කමතෙන් අටුගබඩා හෝ වී තබන යම්කිසි ස්ථානයකට ඉවත්කිරීම හෝ ඉවත්කිරීමට සැලැස්වීම නොකළ යුතුයි.

6. කළුතර කොටමුණේ කුඹුරු අයිති හෝ කුඹුරු වැඩ කරණ, කළුතර කොටමුණෙන් පිට පදිංචි යම්කිසි අයෙකුට කළුතර කොටමුණේ සිට වී ගෙනයන්ට උවමනාවූවිට පදිංචි වැසියන්ගේ උප දිසාපතිතැන, හදිසි කටයුතු පිළිබඳ උප දිසාපතිතැන හෝ ආහාර පාලනය සම්බන්ධ නිලධාරීතැන වෙත නො. D. F. C. 34 දරණ ඉල්ලුම්පත්‍රයේ සඳහන් සියලුම කරුණු සම්පූර්ණකොට ඉල්ලුම්පත්‍ර පිටපත් දෙකක් ඉදිරිපත්කළ යුතුයි.

7. මාස් මෝසමේදී අක්කර බද්ද වෙනුවෙන් අක්කරයට දියයුතු වී බුසල් 1ක වෙල පිහිටි ගමේ ගම් මූලාදැනියාට දිය යුතුයි.

8. යම්කිසි කරුණක් නිසා ඉඩම් අයිතිකරුවෙකුට හෝ ගොවියෙකුට ඔහුගේ වෙලක හෝ වෙල්වල අස්වැන්න අක්කරයට බුසල් 5ට වඩා අඩුය කියා අස්වැන්න කැපීමට පෙර පෙනීයනවානම් ගොයම් කැපීමට මාසයකට පෙර වෙලේ නම, අක්කර ප්‍රමාණය, වෙල පිහිටි ගම, අක්කරයකට ලැබේය කියා

පෙනීයන අස්වැන්න ප්‍රමාණය, අස්වැන්න අඩුවීමට හේතු සඳහන් ලිපියක් රෙජිස්ටර් තැපෑලෙන් මා වෙත එවිය යුතුයි. එසේ නොකර හෝ නියම වේලාවට පෙර දැනුම්නොදෙන අය අක්කර බද්දෙන් නිදහස්කරනු නොලැබේ.

9. ඉහත 5වෙනි වගන්තිය යටතේ ගෙනගිය වී නියමිත කූපන් භාරදී අයිතිකරුම සහ බදු ගොවීන් යැපෙන්නන්ට නියමිතවූ වී ප්‍රමාණය අනුව වී බුසල් 50ට වැඩිනොවනතෙක් ආහාරය වෙනුවෙන් ප්‍රයෝජනය ගැනීම හැර වෙනයම් ක්‍රමයකටවත් නොයෙදිය යුතුයි.

10. ඉහත දැක්වෙන 8වෙනි වගන්තියේ සඳහන් පරිදි ඊළඟ මෝසම දක්වා ප්‍රයෝජනය පිණිස නියමිතවූ ප්‍රමාණය හැර ඉතිරි වී සියල්ල හෝ මා විසින් ඉල්ලාසිටින වී ප්‍රමාණයක් ආණ්ඩුවට විකිණිය යුතුයි.

ෆීල්ඩ් ඇසිස්ටන්ට්තැන ගැන විස්තර ලේඛනය.

| ෆීල්ඩ් ඇසිස්ටන්ට්තැන. | ෆීල්ඩ් ඇසිස්ටන්ට්ට භාර වෙල් මුලාදෑනීන්ගේ වසම්. |
| --- | --- |
| 1. පඹේ, නො. 30, ඇබැම්ස්ට්‍රීට්, කළුතර | 1. එතනමඩ.<br>2. උග්ගල්බඩ.<br>3. උක්වත්ත<br>4. පලාතොට. |
| 2. බෝම්බුවල (කළුතර තැපැල්) | 1. ගමගොඩ.<br>2. සේරුපිට.<br>3. කිනාවියංගල.<br>4. බෝම්බුවල.<br>5. නාගොඩ. |
| 3. පාලයන්ගොඩ (පයාගල තැපැල්) | 1. පාලයන්ගොඩ.<br>2. සුවදවිච්චිමුල්ල.<br>3. වඩුගොඩ.<br>4. යබඩාගොඩ. |
| 4. පොතුවිල (පයාගල තැපැල්) | 1. දූවේගොඩ.<br>2. මිංගන්න. |
| 5. පිංහේන (බේරුවල තැපැල්) | 1. හෙට්ටිමුල්ල.<br>2. පිංහේන.<br>3. කාලමිල.<br>4. කොටපිටිය. |
| 6. වලතර (බේරුවල තැපැල්) | 1. කරදගොඩ.<br>2. කළුවාමෝදර.<br>3. වලතර.<br>4. අඹේපිටිය.<br>5. ඔදනගොඩ. |

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

මේ 1946ක්වූ ජනවාරි මස 15වෙනි දින
කළුතර කච්චේරියේදීය.

---

අත්‍යාහාර මිලයට ගැනීමේ ව්‍යාපාරය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් සහ නැගෙනහිර ගිරුවාපත්තු දෙක තුළ වී සහ කුරක්කන් අස්වැන්න එකතුකිරීම.

අංක 37 දරණ ආරක්ෂා (මිශ්‍ර) ආණ්ඩුපනත් යටතේද, ආරක්ෂක (ආහාර ද්‍රව්‍ය මිලයට ගැනීමේ) ආණ්ඩුපනත් යටතේද, 1943යේ (වී ගොවිතැන්කිරීමේ) ආණ්ඩුපනත් යටතේද; මා වෙත පැවරී තිබෙන බලය අනුව; හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප දිසාපති නැන්සන් සෙඩ්රික් ජේම්ස් මර්ගලාස් වන මා විසින් කෙරෙන නියෝගයයි මේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් සහ නැගෙනහිර ගිරුවාපත්තු දෙක තුල වී හෝ කුරක්කන් වපුරා 1946යේ ජූලි 31වෙනි දිනට ප්‍රථම අස්වැන්න එකතුකිරීමට බලාපොරොත්තුවන සෑම කුඹුරක හෝ හේනක ගොවියා හෝ හිමියා විසින් පහත දැක්වෙන විස්තර; වී වපුරනලද කුඹුරක් පිළිබඳව නම් කුඹුර පිහිටි කොට්ඨාසය භාර වෙල් මුලාදෑනියා වෙතද, කුරක්කන් හේනක් සම්බන්ධව නම් හේන තිබෙන කොට්ඨාසය භාර ගම් මුලාදෑනියාටද ලියමනකින් දැනුම්දිය යුතුයි.

(a) අස්වැන්න කපා පෑගීමට අදහස්කරන දිනය.

(b) ඉඩමේ නම, පිහිටා තිබෙන ස්ථානය සහ එහි ප්‍රමාණය.

(c) යම්කිසි පොරොන්දුවක් හෝ අන්කිසි හේතුවක් නිසා ඉඩමේ අස්වැන්නෙන් කිසියම් කොටසක් ගැනීමට හෝ ලැබීමට නියමවී සිටින අයගේ නම සහ ලිපිනය ලැබෙන පිළිවෙලද.

(d) එවැනි අයට අස්වැන්නෙන් හිමි කොටස හෝ කොටස් ගැන සියළු විස්තර.

2. තවද පහත දැක්වෙන අයුරින් නියෝගකරමි:—

(a) කුඹුරු සහකාර නිලධාරියා හෝ වෙල් මුලාදෑනියා හෝ මා විසින් බලය පවරනලද නිලධාරියකු තමන පරීක්ෂාකර මුළු අස්වැන්න සහ කොටස් සටහන්කරගන්නාතෙක්, (ii.) වෙල් මුලාදෑනියා හෝ මා විසින් බලය පවරනලද වෙන මුලාදෑනියෙකු අයි. පී. ඇස්. 33 (I.P.S.33) පිටපතක බලපත්‍රයක් නිකුත්කරනතෙක්, (iii.) වී ගෙනයන්නාවූ අය විසින් බලපත්‍ර පිටපත් තුනෙහි අත්සන්තබනතෙක්, (iv.) වෙල් මුලාදෑනියා විසින් නිකුත්කරනලද බලපත්‍රයක් උඩ, අක්කරයකට වී බුසල් දෙක බැගින් ඉතා ආසන්න මිලයටගැනීමේ මධ්‍යස්ථානයට අක්කර වී ගෙනගොස් විකුණනතෙක් හෝ අක්කර වී වෙල් මුලාදෑනියාට භාරදෙනතෙක්, කුඹුරෙන් හෝ හේනෙන් වී හෝ කුරක්කන් අටුවට හෝ අන්කිසි ස්ථානයකට නොගෙනිය යුතුයි.

(b) නියමිත ප්‍රමාණයට සහල් සලාක පොත්වලින්, කුඹුරු අයිති ගොවියෙක්නම් බුසලට කෙනෙකුගෙන් පහ බැගින්ද, ගොවිතැන් නොකරන කුඹුරු හිමියන් විසින් බුසලට කෙනෙකුගෙන් අට බැගින්ද කූපන් ගම් මුලාදෑනියාට භාරදෙනතෙක් බලපත්‍ර උඩ ගෙන යන වීවලින් කිසිම කොටසක් ප්‍රයෝජනයට නොගත යුතුයි. පෝෂ්‍ය පිණිස නියමකරනලද වී ප්‍රමාණයනම් කුඹුරු අයිතිකාර ගොවීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන අයට එක් අයෙකුට සතියකට වී සේරු හය බැගින්ද, ගොවිතැනෙහි නොයෙදෙන කුඹුරු හිමියන්ට සහ ඔවුන්ගෙන් යැපෙන අයට කෙනෙකුට සතියකට වී සේරු හතර බැගින්ද වේ. එහෙත් එක පවුලකට එක මෝසමක් සඳහා ලැබියහැකි ඉතා වැඩිම වී ප්‍රමාණය බුසල් පණහක් වේ.

(c) තමන්ගේ පෝෂ්‍යය පිණිස බිත්තර වී සඳහා සහ කම්කරුවන්ට කුලීදීමට වෙන්කරනලද වී හැර වෙන කිසිම වී කොටසක් ආණ්ඩුවේ මිලයටගැනීමේ මධ්‍යස්ථානයකට විකිණීමට ගෙනයනවා මිස අන්කිසි ස්ථානයකට ගෙනයාම හෝ වියදම්කිරීම නොකළ යුතුයි.

(d) කමතින් අටුවට හෝ ගබඩාකරන ස්ථානයට වී ගෙනයාමට ලැබෙන අයි. පී. ඇස්. 33 දරණ බලපත්‍ර වී ගෙනයාම අවසන්වූ වහාම අටුව හෝ ගබඩාව පිහිටා තිබෙන කොට්ඨාසයේ ගම් මුලාදෑනියාට භාරදිය යුතුයි. කෙසේ මුත් බලපත්‍රයේ කාලය ඉකුත්වී දින දෙකක් ගතවන්ට පෙර එය ගම් මුලාදෑනියා වෙත ලැබිය යුතුයි.

3. කමතේ සිට කෙලින්ම, එම ප්‍රාදේශික ආදායම් නිලධාරී තැනගේ දේශසීමාව ඇතුලත පිහිටි රජයේ මිලයට ගැනීමේ මධ්‍යස්ථානයකට වී ගෙනයාම පිණිස වෙල් මුලාදෑනියා විසින් බලපත්‍ර නිකුත්කරනු ලැබේ. හේනකින් එම ප්‍රාදේශික නිලධාරී තැනගේ දේශසීමාව තුල පිහිටි රජයේ මිලයට ගැනීමේ මධ්‍යස්ථානයකට කුරක්කන් ගෙනයාම පිණිස බලපත්‍ර ගම් මුලාදෑනියා විසින් දෙනු ලැබේ. අටුවෙන් හෝ ගබඩාවෙන් එම පත්තුව තුල පිහිටි මිලයටගැනීමේ මධ්‍යස්ථානයකට වී ගෙනයාම පිණිස බලපත්‍ර නිකුත්කරනු ලැබෙන්නේ ගම් මුලාදෑනියා විසිනි.

4. එක ප්‍රාදේශික ආදායම් නිලධාරියෙකුගේ පත්තුවකින් තවත් පත්තුවකට හෝ හදිසි කටයුතු පිළිබඳ උප දිසාපතිවරයෙකුගේ කොට්ඨාසයෙන් වෙන කොට්ඨාසයකට හෝ එක් දිස්ත්‍රික්කයකින් තවත් දිස්ත්‍රික්කයකට වී ගෙනයාම පිණිස බලපත්‍ර ලබාගැනීමට ඒ සඳහා නියමකරනලද ඉල්ලුම්පත්‍ර පිට පතකින් ඉල්ලුම්කරු පදිංචිවී සිටින පලාතේ නියෝජ්‍ය ආහාර පාලකතුමාගෙන් හෝ හදිසි කටයුතු පිළිබඳ උප දිසාපතිතුමාගෙන් ඉල්ලුම්කළ යුතුයි. එම ඉල්ලුම්පත්‍ර පිටපත් ඉහතකී කාර්යාලවලින් ලබාගත හැක.

5. යම් පත්තුවකින් වී හෝ කුරක්කන් ගෙනයාමට ඉල්ලුම් කරන වලහන්කාරයන් අස්වැන්න එකතුකිරීම පටන්ගන්ට පෙර ඔවුන්ගේ නාමයන් ගොවිකම් නිලධාරීතැනගේ ලේඛනයෙහි ලියාපදිංචි නොකලේනම් එවැනි ඉල්ලුම්පත්‍ර ගැන සලකනු නොලැබේ. එනිසා වලහන්කාරන්නාවූ සියළුම අයට වැඩ පටන් ගන්ට පෙර ඔවුන්ගේ නාමයන් ගොවිකම් නිලධාරීතැනගේ ලැයිස්තුවෙහි ලියාපදිංචිකොට අත්සන් තබා වැඩකිරීමට නියම කරනත් කුඹුරුවල නම් ආදී විස්තර නිවැරදිව සඳහන්කරන ලෙස අවවාදකරමි.

6. මාගම්පත්තුවේ සහ නැගෙනහිර ගිරුවාපත්තුවේ පිහිටි යම්කිසි කුඹුරක අස්වැන්නෙන් කොටසක් ගැනීමට හෝ ලැබීමට සුදුසුකම් ඇති සියළුම ගව හිමියන්; ගොවීන් සහ වෙනත් අය අස්වැන්න කැපීම පටන්ගන්ට පළමුව තමන්ගේ නාමයන්, ලිපින ලැබෙන පිළිවෙල ආදිය, වී පිළිබඳවනම් වෙල් මුලාදෑනියාටද, කුරක්කන් පිළිබඳව නම් ගම් මුලාදෑනියාට දන්වීමට අමතක නොකළයුතු බව මෙයින් දැනුම්දෙමි. එය නොකරනලද කිසිම අයකුට වී හෝ කුරක්කන් ගෙනයාමට බලපත්‍ර නොලැබෙන බව දතයුතුයි.

7. අස්වැන්න කමතට ගෙනගොස් එහි මැඩ පිළිවෙළ අවසානවන දින සිට සති හයක් ගතවන්ට ප්‍රථම වී හෝ කුරක්කන් ගෙනයාම පිණිස දනහ විස්තරකරනලද ආකාරයට ඉල්ලුම්පත්‍ර ඉදිරිපත්නොකළහොත් සියලුම වී අභ්‍යන්තර මිලයට ගැනීමේ ව්‍යාපාරය යටතේ බලයෙන් ආණ්ඩුවට ගනුලැබේ.

සී. ජේ. ඔර්ලොෆ්,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප දිසාපති.

වම් 1946ක්වූ ජනවාරි මස 19වෙනි දින
හම්බන්තොටදීය.

---

ආරක්ෂක (වී ගොවිතැන පිළිබඳ) ව්‍යවස්ථා.

ආරක්ෂක (විවිධ) ව්‍යවස්ථාවල 37වෙනි වගන්තියද, ආරක්ෂක (ආහාර ද්‍රව්‍ය මිලයටගැනීම් සම්බන්ධ) ව්‍යවස්ථාද; ආරක්ෂක (වී ගොවිතැන පිළිබඳ) ව්‍යවස්ථාද යන මෙකී ව්‍යවස්ථාවල ප්‍රකාර මට ලැබී තිබෙන බලය පරිදි මෙහි පහත සඳහන් කරුණු මම නිවේදනයකරමි.

1. හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල්කෝරළ යන්හි 1.1.46 සිට 30.6.46 දක්වා අතර කාලය තුල අස්වැන්න ලැබීමට බලාපොරොත්තුවන සෑම කුඹුරු හිමියෙක් හා ගොවියෙක් පහත සඳහන් කරුණු කෝරළය කරවන නිලධාරීතුමාට (D. R. O.) ලැබෙන පරිදි එකී අස්වැන්න කැපීමට ඉතා අඩු වශයෙන් සති දෙකකට ප්‍රථම දැනුම්දිය යුතුයි:—

(අ) අස්වැන්න කැපීමට හා පෑගීමට බලාපොරොත්තුවන දින;

(ආ) කුඹුරේ නම; පිහිටීම හා වපසරිය,

(ඇ) කුඹුරේ අස්වැන්න ලබන්ට සිටින අයගේ නම සහ ලිපිනම ලැබෙන පිළිවෙල,

(ඈ) ඒ එක් එක් අයෙකුට ලැබියයුතු කොටස් ප්‍රමාණය හා ඒ කුඹුරේ කොටස්කූ යන වග.

2. තවද මේ ප්‍රමාණය කොට්ඨාශ භාර ගම් මුලාදෑනියා විසින් තක්සේරුකොට ගෙනයෑමට බලය දෙනතුරු කුඹුරෙන් හෝ කමතෙන් හෝ බැහැරනොකළ යුතුයි. යම් හෙයකින් එම වී කෝරළයෙන් පිටත ගෙනයෑමට උවමනාවනිනම් ඒ සඳහා බලපත්‍රයක් මගෙන් ලබාගත යුතුයි.

ජේ. ඇල්. ඒ. ප්‍රනාන්දු,
හලාවත දිස්ත්‍රික්කයේ (හදිසි කටයුතු පිළිබඳ)
උප දිසාපතිතුමා.

වම් 1946ක්වූ ජනවාරි මස 21වෙනි දින
හලාවත කච්චේරියේදීය.

---

ලංකා සේවිංස් බැංකුවේ පොලී පිළිබඳ දැන්වීමයි.

සිලෝන් සේවිංස් බැංකුවේ මුදල් තැන්පත්කරන්නන්ට 3වෙනි නියෝගය යටතේ 1946 අවුරුද්දට ගෙවියයුතු පොලියේ ප්‍රමාණය සියයට 2½ක් බව එම බැංකුවේ ඩිරෙක්ටර්වරුන් විසින් දන්වා සිටිනු ලැබේ.

ලෙස්ලි. වී. කුරේ,
සෙක්‍රතාරිස්තැන.

වම් 1946ක්වූ ජනවාරි මස 12වෙනි දින
කොළඹ සිලෝන් සේවිංස් බැංකුවේදීය.

---

දැන්වීමයි.

වත්තල පලාතේ ආණ්ඩු සභාවේ පෙදෙසේ පහත සඳහන්වන මායිම්වන පෙදෙසේ රෝග සහිත පෙදෙසක් බැවින් මෙන්කර තැබීම සහ රෝගවලින් වැලැක්වීම පිළිබඳ ආඥාපනත යටතේ මෙයින් ප්‍රකාශකරනු ලැබේ. එනම්:—උතුරට අළුත්නුවර වික්ටෝරියාපාලම සිට සතරවෙනි සැතපුම් කනුව දක්වාද; නැගෙණහිරට පරණ නුවර පාරේ සන්දිය දක්වාද; බස්නාහිරට කැලණිගඟ වික්ටෝරියා පාලම සිට පෑලියගොඩ තොටුපල දක්වාද; දකුණට කැලණිගඟ සහ නුවර පාරේ සන්දිය දක්වාද යන සීමාවතුල තගනම් පැත්තක් බව මෙයින් ප්‍රකාශකරණු ලැබේ.

මීට,

ඩී. ඇෆ්. ඇම්. කුලතුංග,
වත්තල පලාත් ආණ්ඩු සභාවේ සභාපති.

වම් 1946ක්වූ ජනවාරි මස 16වෙනි
දින වත්තලදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.